# වාර්ෂික වාර්තාව
# 2011

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තොරතුරු

| | |
|---|---|
| **ආයතනය** | - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය. |
| **අමාත්‍යාංශය** | - යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය. |
| **ලිපිනය** | - "නිපුණතා පියස"<br>නො. 354/2,<br>ඇල්විටිගල මාවත,<br>නාරාහේන්පිට,<br>කොළඹ 05. |
| **ඊ මේල් ලිපිනය** | - info@vtasl.gov.lk |
| **වෙබ් අඩවිය** | - www.vta.lk |
| **විගණකවරු** | - විගණකාධිපති<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| **බැංකුකරුවන්** | - මහජන බැංකුව<br>- ලංකා බැංකුව<br>- කොමර්ෂල් බැංකුව |

# පිළිගැන්වීම

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

"නිපුණතා පියස"

නො : 354/2,

ඇල්විටිගල මාවත,

කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

**වාර්ෂික වාර්තාව - 2011**

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ 25 වන වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව 2011 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට,

විශ්වාසී,



ධම්මික හේවාපතිරණ.
සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.
2012.03.15

# අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ කාර්මික, වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව ලබාදෙන ප්‍රමුඛතම ආයතනය වීම.

# අපගේ මෙහෙවර

ජාතික හා ජාත්‍යන්තර නිපුණ සම්මතයන්ට ගැලපෙන නිපුණ ශිල්පීන් බිහිකරන ආයතනයක් ලෙස කටයුතු කිරීම.

# පටුන


| | |
|---|---|
| 1. පාලක මණ්ඩලයේ වාර්තාව | 01-05 |
| 2. හැඳින්වීම | 06 |
| 3. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ව්‍යුහය | 07-12 |
| 4. කාර්ය මණ්ඩලය පුහුණු කිරීම | 13-15 |
| 5. වෘත්තීය පුහුණුව ලබාදීම | 16-25 |
| 6. වෘත්තීය මාර්ගෝපදේශනය | 26-27 |
| 7. රැකියාගත කිරීම | 28-30 |
| 8. ශිල්පීය දක්ෂතා වැඩි දියුණු කිරීම | 31 |
| 9. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම | 32-34 |
| 10. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 34 |
| 11. අභියෝග | 35 |

**පාලක මණ්ඩලයේ වාර්තාව**

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ජාතික වෘත්තීය පුහුණු ආයතන 06 ක්, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 23 ක් හා ග්‍රාමීය වෘත්තීය පුහුණ මධ්‍යස්ථාන 232 කින් සමන්විත මධ්‍යස්ථාන ජාලයක් තුලින් ග්‍රාමීය තරුණ තරුණියන්ට කුසලතා පුහුණුව ලබා දෙමින් සිටී.

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම ආයතනය 2011 වර්ෂයේදී එහි පරමාර්ථයන්ට අදාලව පහත සඳහන් කාර්යයන්හි යෙදුන අතර, එහි ප්‍රගතිය ඉදිරි පරිච්ජේදයන්හී විස්තර කර ඇත.

- වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම තුළින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම හා වෘත්තීය නිපුණතා ලබා ගත හැකි වන පරිදි අවශ්‍ය පුහුණුව සෘජුව හෝ අනිකුත් ආයතන තුළින් ලබා දීම.

## ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම, අවසන් පරීක්ෂණ පැවැත්වීම සහ ජාතික වෘත්තීය සහතික නිකුත් කිරීම.

- වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශන ලබාදීම.

- වෘත්තීය පුහුණු වැඩසටහන් ඵලදායී ලෙස හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- වෘත්තීය පුහුණුව ලැබූ තරුණ පිරිසට වැඩිදුර පුහුණුව ලබාදීම, රැකියා ගත කිරීම හා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.

- රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමග සම්බන්ධතා ගොඩ නැගීම මගින් ශිල්පීය දක්‍ෂතා වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.
- වෘත්තීය පුහුණුව ග්‍රාමීය ප්‍රදේශ කරා ගෙන යාම.
-

## 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය අත්පත් කරගන්නා ලද ජයග්‍රහණයන්

- කැනේඩියානු ලෝක විශ්ව විද්‍යාල සේවය (WUSC) ව්‍යාපෘති ආධාර වශයෙන් මුලතිව්,කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි පුහුණු මධ්‍යස්ථාන 03ක් ඉදිකිරිම හා ඒවායේ පාඨමාලා ආරම්භ කිරිම.
- කැනේඩියානු ලෝක විශ්ව විද්‍යාල සේවයේ (WUSC) ආධාර යටතේ උතුරු ප්‍රදේශවල පවත්නා ගොඩනැගිලිවල පාඨමාලා 10ක් ආරම්භ කිරිම.
- ඉන්දියානු රජයේ ආධාර (HMTI) යටතේ නුවරඑළිය හා වන්දාරමුල්ල දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානවල ගොඩනැගිලි නවීකරණය කිරීම,පුහුණු උපකරණ ලබාදිම හා කාර්යය මණ්ඩලයෙන් 22 දෙදෙනෙකු හට ඉන්දියානු පුහුණු ආයතනයන්ට අනුයුක්ත කර පුහුණුව ලබා දිම.
- 2010 වසරේ පුහුණුව අවසන් කළ සිසුන්ගෙන් 8102 ක් රැකියාගත පුහුණුව සඳහා යොමු කිරිම.
- 2011 වසර තුළ විදේශ රැකියා සඳහා 98 දෙනෙක් ද ස්වයං රැකියා සඳහා , 593 දෙනෙක්ද , දේශීය රැකියා සඳහා5,927 දෙනෙක්ද වශයෙන් පුහුණුලාභීන් 6,618 ක් රැකියා සඳහා යොමු කිරීමට හැකිවීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශය අතර සම්බන්ධතාවය ගොඩනැංවීමේ අපේක්ෂාවෙන් ඇලුමෙක්ස් පුද්ගලික සමාගම, ඒ.බී.මයුරි සමාගම, ලංකා ටයිල්ස් සමාගම, ඩෙවිඩ් පීරිස් සමාගම නේචර්ස් බියුටි ක්‍රියේෂන් සමාගම හා ඔරිෆ්ලේම් පුද්ගලික සමාගම යන ප්‍රමුඛපෙළේ සමාගම් හා එක්ව විවිධ ක්ෂේත්‍රයන්හි ශිල්පීන් 3029 ක් සඳහා ශිල්පීය කුසලතා වැඩිදියුණු කිරීමේ කෙටි කාලීන වැඩමුළු 35 ක් පැවැත්වීම .

- දිවයින පුරා වැඩමුළු 1,022 ක් පවත්වමින් පාසල් ළමුන් ,පාසල් හැරයන්නන් ,දෙමාපියන් හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුවන්නන් 108,607ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවා සැපයීම.

- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 39 ක් හා ව්‍යාපාර කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 31 ක් තරුණ තරුණියන් 1,542 දෙනෙකු සහභාගී කරගනිමින් පැවැත්වීම.

- ස්වයං රැකියා සඳහා යොමු වූ පුහුණුලාභීන් 160 දෙනෙකුට රුපියල් මිලියන 28 කට ආසන්න මුදලක් ණය පහසුකම් වශයෙන් මහජන බැංකුව හා වයඹ සංවර්ධන බැංකුව, රුහුණු සංවර්ධන බැංකුව මගින් ලබා ගැනිමට අවශ්‍ය පහසුකම් සැපයීම.

- එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි නවීකරණය කොට පාඨමාලා 09ක් ආරම්භ කිරිම.

- හෝටල් හා සංචාරක ක්ෂේත්‍රය දියුණු කර රැකියා අවස්ථා සුලබ කිරීමේ ජාතික ප්‍රතිපත්තියට දායක වෙමින් එම ක්ෂේත්‍රයට අදාල නිපුණ ශිල්පීන් බිහි කිරීම.

- “මහින්ද චින්තන ඉදිරි දැක්ම” සංකල්පයට අනුව පුහුණුලාභීන්ට වැඩි වැටුපක් ලබා ගත හැකි පරිදි තොරතුරු තාක්‍ෂණ, රූපලාවන්‍ය හා හෝටල් හා සංචාරක පාඨමාලා ව්‍යාප්ත කිරීම.

- වෘත්තිය පුහුණුව ලබා දෙන ආයතන අතුරින් ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) සහතිකපත් ලබා දීමේ ප්‍රමුඛයා වීමට හැකි වීම.

- ජාතික මට්ටමේ සංවිධාන වන ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය හෝටල් හා සංචාරක (ශ්‍රී ලංකා) සංවිධානය තොරතුරු තාක්‍ෂණය පිළිබද සමාගම් හා එක්ව විශේෂ සැසිවාරයන් පැවැත්වීම මගින් ඒ ඒ ක්ෂේත්‍රයන්හි පුහුණුලාභීන්ට රැකියා අවස්ථා ලබා ගැනීම.

## 2012 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන් සහ අපේක්ෂිත ඉලක්ක.

- හෝටල් හා සංචාරක, පරිගණක හා තොරතුරු තාක්ෂණය, ප්‍රජා සංවර්ධනය, මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තුව යන ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛතාවය ලබාදෙමින් දේශිය හා විදේශිය ශ්‍රම වෙළඳ පොළ ඉල්ලුමට සරිලන ලෙස පුහුණුලාභින් 29,315 ක් පුහුණු කිරීම.

- පුහුණු පරිසරය වැඩිදියුණුකර ගුණාත්මක වෘත්තිය පුහුණුවක් ලබා දීම අරමුණු කර ගනිමින් පවතින සියලුම මධ්‍යස්ථාන වර්ගීකරණය කර සංවර්ධනය කිරීම.

- තෝරාගත් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම්,මෝටර් කාර්මික, ලෝහ ආශ්‍රිත, විදුලි, රෙදිපිළි හා තොරතුරු තාක්ෂණික ක්ෂේත්‍ර සඳහා පුහුණු කේන්ද්‍රයන් (Training Hubs) 48 ක් ස්ථාපිත කිරීම.

- සමාජයේ සමාන අවස්ථා අහිමි වූ වෙනස් වූ හැකියාවන්ගෙන් යුත් තරුණ තරුණියන් හට රැකියා හා ස්වයං රැකියාවන් සඳහා යොමු වීමට හැකිවන පරිදි පුහුණු අවස්ථා සලසා දීම.

- නව කළමනාකරණ උපාය මාර්ග යොදාගනිමින් තරුණ තරුණියන් වෘත්තීය පුහුණුවට යොමුකර රැකියාගත කිරිමේ අරමුණින් නිපුණතා බලකා සවිබල ගැන්වීම, නිපුණතා යෞවන සමාජ පිහිටුවීම, ආධුනිකයන් පුහුණු පරිසරයට අනුගත කිරිමේ වැඩසටහන් පැවැත්වීම හා පාසැල් වෘත්තිය මාර්ගෝපදේශන කව පිහිටුවීම.

- දිවයිනේ සියලුම බන්ධනාගාර ආවරණය වන පරිදි තෝරාගත් පුහුණු පාඨමාලා පැවැත්විම.

- ක්‍රියාත්මක වන සියළුම පාඨමාලා සඳහා ජාතික වෘත්තිය සුදුසුකම් ලබා ගැනීමට කටයුතු කිරීම.

- සියළුම වෘත්තිය පුහුණු පාඨමාලා ප්‍රතිතනය කිරීම හා සියළු පුහුණු මධ්‍යස්ථානයන් හී තත්ව කළමණාකරණ පද්ධති ස්ථාපිත කිරීම.

- පුහුණු මධ්‍යස්ථාන ප්‍රතිව්‍යුහගතකරණය කිරිම යටතේ සෑම දිස්ත්‍රික්කයක් සඳහාම හෝටල් හා සංචාරක, මෝටර් වාහන අළුත් වැඩියාව හා නඩත්තුව, රෙදිපිළි සහ ඇඟළුම්, පෞරුෂ හා ප්‍රජා සංවර්ධනය,පරිගණක හා තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍ර සඳහා විශේෂ පුහුණු මධ්‍යස්ථාන ඇති කිරිම.

- දිවයිනේ සෑම ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයකම අවම වශයෙන් එක් පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරිමේ සංකල්පය යටතේ දැනට පුහුණු මධ්‍යස්ථාන නොමැති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හී නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරිම
- ප්‍රමාණවත් පහසුකම් නොමැති හා ජනගහණය අඩු ප්‍රදේශවල හුදෙකලාව පවතින මධ්‍යස්ථාන වෙනුවට එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයක එක් මධ්‍යස්ථානයක් වන සේ සලකා පහසුකම් ඇති ස්ථානවල නැවත ස්ථානගත කිරිම.
- අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව පාසැල් ළමුන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරිම සඳහා තොරතුරු තාක්ෂණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම (VIRTUSA ආයතනය හා ඒකාබද්ධව)
- සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් සියලුම අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරිම හා පුහුණු කිරිම.



ධම්මික හේවාපතිරණ

සභාපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

## 02. හැඳින්වීම

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කරන ලදී.

## 03. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ව්‍යුහය.

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනතේ 5 වන වගන්තියට අනුව පත්කරනු ලබන සභාපතිවරයකු, උප සභාපතිවරයකු ඇතුළු සාමාජිකයන් 12 දෙනෙකුගෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලය සමන්විත වේ.

| | | |
|---|---|---|
| 1 | නීතිඥ ධම්මික හේවාපතිරණ මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | සභාපති |
| 2 | නීතිඥ ලෙස්ලි වීරමන්ත්‍රී මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | උප සභාපති |
| 3 | පී.රණේපුර මයා<br>අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | සාමාජික |
| 4 | හේරත් යාපා මහතා<br>අතිරේක කම්කරු කොමසාරිස් ජෙනරාල්,කම්කරු දෙපාර්තමේන්තුව | සාමාජික |
| 5 | එච්.එන්.එන්. ගුණසේකර මහත්මිය<br>අධ්‍යක්ෂ (සැලසුම්), කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | සාමාජික |
| 6 | කේ.එම්. එම්.සිරිවර්ධන මහතා<br>අධ්‍යක්ෂ ජෙනරාල්<br>රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | සාමාජික |
| 7 | ආචාර්ය තිස්ස ජිනසේන මහතා<br>සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | සාමාජික |
| 8 | ඒ.ආර්. දේශප්‍රිය මහතා<br>අතිරේක ලේකම් (වෘත්තිය පුහුණු)<br>යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය<br>(2011.07.07 දින සිට) | සාමාජික |
| 9 | නිමල් වීරතුංග මහතා<br>සම්බන්ධීකාරක (මාධ්‍ය සහ මහජන සම්බන්ධතා)<br>කෘෂි හා ගොවිජනසේවා රක්ෂණ මණ්ඩලය | සාමාජික |

| | | |
|---|---|---|
| 10 | කේ.සී.ජ්. අරුණදේව සිල්වා මහතා<br>සම්බන්ධීකරණ ලේකම්<br>යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය<br>(2011.06.20 දින සිට) | සාමාජික |
| 11 | උදය හිත්තැටියගේ මහතා<br>කළමනාකාර අධ්‍යක්ෂ, ඩී.ර්. ටෙක්නොලොජීස්. | සාමාජික |
| 12 | නිතීඥ කිර්ති කලුආරච්චි මහතා | සාමාජික |
| 13 | මේජර් මංගල පෙරේරා මහතා<br>සම්බන්ධිකරණ ලේකම්<br>යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය<br>(2011.02.24 සිට 2011.04.08 දින දක්වා) | සාමාජික |
| 14 | යූ. ජී. කේ. සමරසේකර මහතා<br>අතිරේක ලේකම්, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන<br>අමාත්‍යාංශය (2011.07.15 සිට 2011.04.08 දින දක්වා) | සාමාජික |

2011 වර්ෂයේදී පවත්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව **12**

මෙම වර්ෂයේදී පවත්වා ඇති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව **04**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි ලෙස සභාපතිතුමා කටයුතු කරන අතර, ඔහුගේ සහාය සඳහා උප සභාපති වරයෙකු, අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකු ඇතුළු නිළධාරීන් 1754 දෙනෙකුගෙන් සමන්විත කාර්යය මණ්ඩලයක් ඇත.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය මණ්ඩලය.

| | |
|---|---|
| සභාපති | නීතීඥ ධම්මික හේවාපතිරණ මහතා |
| උප සභාපති | නීතීඥ ලෙස්ලි වීරමන්ත්‍රී මහතා |
| අධ්‍යක්ෂවරු | 1.සී.විදාන පතිරණ මහතා |
| | 2.ජී.එම්.පී.ජ්.ගල්ලබ මහතා (2011.12.01 දින සිට) |
| | 3.කේ.ජේ.කෝරළගේ මහතා |
| | 4.එස්.ජ්.ඩී.ජේ.චන්ද්‍රකුමාර මහතා (තාවකාලිකව සේවය අත්හිටුවා ඇත.) |
| | 5. කේ.සරත් ආනන්ද මහතා (වැ.බ.) |
| | 6. එන්. කේ. ජේ. ද. සිල්වා මහතා (වැ.බ.)(2011.06.20දිනසිට) |
| නියෝජ්‍ය අධ්‍යක්ෂවරු | 1. මහින්ද ජයතිලක මහතා |
| | 2. එච්. එම්. ඒ. හේරත් මහතා. (විශ්‍රාම ගන්වා ඇත.) |
| | 3. ඩබ්.ඩී. ප්‍රනාන්දු මහතා |
| | 4. ඩබ්. ඒ. රණවීර මහතා |
| | 5.සම්පත් අබේගුණසේකර මහතා. (2011. 06. 20 දිනසිට) |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1. එච්.යූ. කාරියවසම් මහතා |
| ව්‍යාපෘති සම්බන්ධීකාරක | 1. සී. ආර්. සමරවීර මහතා (2011. 07. 15 දින සිට) |
| සහකාර අධ්‍යක්ෂවරු | 1. එන්. ඩී.පී. ධම්මික මහතා |
| | 2. ඩබ්.ඩබ්. සොයිසා මහතා |
| | 3. එන්. එස්.ඩී.නවරත්න මහතා |
| | 4. ඩී.ආර්.එස්.එල්. දසනායක මහතා |
| | 5. යූ.කේ.නන්ද මහතා |
| | 6. එච්. ඩබ් .ආර්. පී. විජේසේකර මහතා |
| | 7. පී.එම්. පෙරේරා මහතා |
| | 8. ටී.ඩී.එස්. සංසදාස මහතා |
| | 9. ඒ.කේ.ආරච්චිගේ මහතා |
| | 10. ඩබ් ජී විජේරත්න මහතා |

11. ටී.විනෝදරාජා මහතා
12. ඒ.ඒ. ජබීර් මහතා
13. එම්.ඒ.කයියූම් මහතා (2011. 03. 29 දක්වා)
14. ජී.වී.පී.එන්. පෙරේරා මහතා
15. ර්.ඒ.ඩී.එස්.සේනාරත්න මහතා
16. එච්. ඩබ්. රොහාන් ප්‍රියන්ත මහතා(වැ.බ) (2011.01.01 දින සිට)
17. එච්. ඩබ්. ඉලේසිංහ (වැ.බ.) (2011.01.01 දින සිට)
18. ඒ. එම්. ඒ. ජයතිස්ස මහතා (වැ.බ.) (2011.01.01 දින සිට)
19. ජී. ඩී. ජයසිංහ මහතා (වැ.බ.) (2011.01.01 දින සිට)
20. ආර්. එන්. කේ. එම්. ජේ. සෙනෙවිරත්න මහතා (2011.01.01 දින සිට)
21. ජී. ජී. නිමල්සිරි මහතා (වැ.බ.) (2011.01.0**5** දින සිට)
22. කේ. මිල්ටන් මහතා (වැ.බ.) (2011.11.01 දින දක්වා)
23. එම්. පී. ටී. රත්නායක මහතා (කෝන්ත්‍රාත් (2011.01.01 දින සිට)
24. ජී. ආර්. එම්. සී. කුලතුංග මිය (වැ.බ.) (2011.01.01 දින සිට)
25. කේ. ඒ. ලලිතධීර මහතා (වැ.බ.) (2011.01.01 දින සිට)
26. එච්. පී. මනම්පේරි මහතා (වැ.බ.) (2011.01.01 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / නීති නිලධාරි

1. ඒ.ඒ.එච්.අයි.අමරතුංග මිය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා 2011 වර්ෂයට අනුමත කාර්ය මණ්ඩලය 1931 කි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2010.12.31 දිනට බඳවාගෙන ඇති සේවක ප්‍රමාණය 1754 කි.

# කාර්යය මණ්ඩල තොරතුරු 2011

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය | වර්ෂය අවසානයේ පුරප්පාඩු / |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජෙනරාල් | 1 | 1 | 0 |
| 2 | අධ්‍යක්ෂ | 5 | 4 | 1 |
| 3 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 5 | 4 | 1 |
| 4 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 5 | සහකාර අධ්‍යක්ෂ | 25 | 17 | 8 |
| 6 | ජ්‍යෙෂ්ඨ පුහුණු කළමනාකරු | 10 | 6 | 4 |
| 7 | අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් / නීති නිලධාරී | 1 | 1 | 0 |
| 8 | ගණකාධිකාරී | 2 | - | 2 |
| 9 | පුහුණු කළමනාකරු | 38 | 28 | 10 |
| 10 | පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| 11 | ලේකම් | 5 | 8 | -3 |
| 12 | කළමනාකරු (ප්‍රවාහන) | 1 | 0 | 1 |
| 13 | කළමනාකරු (සැපයුම්) | 1 | 1 | 0 |
| 14 | කළමනාකරු (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 15 | විගණන නිලධාරී | 1 | 1 | 0 |
| 16 | පද්ධති විශ්ලේෂක | 1 | 0 | 1 |
| 17 | පුහුණු නිලධාරී | 33 | 28 | 5 |
| 18 | පර්යේෂණ නිලධාරී | 2 | 2 | 0 |
| 19 | සැළසුම් නිලධාරී | 2 | 2 | 0 |
| 20 | පරීක්ෂණ හා ඇගයීම් නිලධාරී | 3 | 0 | 3 |
| 21 | විමර්ශන නිලධාරී | 1 | 0 | 1 |
| 22 | ගිණුම් සහකාර | 22 | 26 | 4 |
| 23 | විගණන සහකාර | 4 | 4 | 0 |
| 24 | වැඩසටහන් නිලධාරී | 42 | 29 | 13 |
| 25 | වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරී | 13 | 12 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| 26 | රැකියාගත කිරීමේ නිලධාරී | 24 | 18 | 6 |
| 27 | ඖෂධ උපදේශක | 26 | 24 | 2 |
| 28 | ව්‍යාපෘති සහකාර | 115 | 51 | 64 |
| 29 | ප්‍රධාන ගබඩා නිලධාරී | 1 | 1 | 0 |
| 30 | ප්‍රධාන ලිපිකරු | 2 | 2 | 0 |
| 31 | අධීක්ෂක (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 32 | ගොඩනැගිලි අධීක්ෂක | 1 | 0 | 1 |
| 33 | නේවාසිකාගාර පාලක | 2 | 1 | 1 |
| 34 | උපදේශක | 1179 | 1147 | 32 |
| 35 | ලඝු / යතුරු ලේඛක | 5 | 5 | 0 |
| 36 | ගබඩා නිලධාරී | 24 | 22 | 2 |
| 37 | ලිපිකරු / යතුරු ලේඛක | 88 | 87 | 1 |
| 38 | ගිණුම් ලිපිකරු | 23 | 19 | 4 |
| 39 | විගණන ලිපිකරු | 3 | 1 | 2 |
| 40 | මුදල් අයකැමි | 1 | 1 | 0 |
| 41 | පරිගණක ක්‍රියාකරු | 5 | 5 | 0 |
| 42 | අකුරු අමුණන්නා (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 43 | පිළිගැනීමේ නිලධාරී/ දුරකථන ක්‍රියාකරු | 2 | 2 | 0 |
| 44 | යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 45 | පොත් බඳින්නා (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 46 | මුද්‍රණ සහකාර | 3 | 2 | 1 |
| 47 | රියදුරු | 32 | 32 | 0 |
| 48 | කා.කා.ස | 3 | 4 | -1 |
| 49 | මුරකරු | 72 | 55 | 17 |
| 50 | ගබඩාකරු | 3 | 2 | 1 |
| 51 | කම්කරු | 89 | 90 | -1 |
| 52 | සනීපාරක්ෂක කම්කරු | 3 | 2 | 1 |
| 53 | මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරී | - | 1 | - |
| **එකතුව** | | **1931** | **1754** | **177** |

සේවයේ නියතු 1754 ක් වන කාර්යය මණ්ඩලයේ පහත පරිදි වැඩ බලන හා කොන්ත්‍රාත් පදනමේ සේවය කරන නිලධාරීන්ද වේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | තනතුරු ස්වාභාවය |
|---|---|---|
| අධ්‍යක්‍ෂ | 02 | වැඩබලන |
| නියෝජ්‍ය අධ්‍යක්‍ෂ | 01 | වැඩබලන |
| සහකාර අධ්‍යක්‍ෂ | 12 | වැඩබලන |
| | 01 | කොන්ත්‍රාත් |
| මාධ්‍ය සම්බන්ධීකාරක | 01 | කොන්ත්‍රාත් |
| පුහුණු කළමනාකරු | 09 | වැඩබලන |
| ලේකම් | 01 | කොන්ත්‍රාත් |
| ගණකාධිකාරි | 01 | වැඩබලන |
| සහකාර ගණකාධිකාරි | 01 | කොන්ත්‍රාත් |
| පුහුණු නිලධාරී | 01 | කොන්ත්‍රාත් |
| වැඩසටහන් නිලධාරී | 01 | කොන්ත්‍රාත් |
| වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරී | 01 | කොන්ත්‍රාත් |
| උපදේශක | 550 | කොන්ත්‍රාත් |
| ලිපිකරු / යතුරු ලේඛක | 02 | කොන්ත්‍රාත් |
| මුරකරු | 04 | කොන්ත්‍රාත් |
| කම්කරු | 26 | කොන්ත්‍රාත් |

## 04. කාර්යය මණ්ඩලය පුහුණු කිරීම.

2011වර්ෂය සඳහා කාර්යය මණ්ඩලය පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් විශේෂ අවධානයක් යොමුකළ අතර, කාර්යය මණ්ඩලයේ දැනුම, ආකල්ප හා කුසලතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් සංවිධානය කල පුහුණු වැඩසටහන් තුලින් නිලධාරින් 49 දෙනෙකු විදේශීය පුහුණු වැඩසටහනක් සඳහා ද, නිලධාරීන් 1139 දෙනෙකු දේශීය පුහුණු වැඩසටහන් සඳහා ද සහභාගී කරවන ලදී.

එක් එක් කාණ්ඩයන් හි නිලධාරීන් බොහෝ විට දේශීය පුහුණු වැඩසටහන් දෙකකට වඩා සහභාගී වූහ. මෙම නිලධාරීන් අතුරින් 924 දෙනෙකු අධ්‍යයන කාර්යය මණ්ඩලයට අයත් නිලධාරීන් වන අතර, 215 දෙනෙකු අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් වෙති.

ඒ ඒ පුහුණු වැඩසටහන් පිලිබඳ විස්තර පහතින් දැක්වේ.

## විදේශීය පුහුණුව (අධ්‍යයන කාර්යය මණ්ඩලය) 2011

| | ශිෂ්‍යත්වය | රට | සහභාගී වූ |
|---|---|---|---|
| 1 | ව්‍යවසායකත්ව සංවර්ධනය | ඉන්දියාව | 01 |
| 2 | CISCO වැඩමුළුව | ඕස්ට්‍රේලියාව | 02 |
| 3 | කාර්මික හා වෘත්තිය අධ්‍යයන වැඩමුළුව | සිංගප්පූරුව | 01 |
| 4 | HMTI ව්‍යාපෘතිය යටතේ ඒ ඒ ක්ෂේත්‍ර සඳහා විශේෂ පුහුණුව | ඉන්දියාව | 24 |
| 5 | උගන්ඩා රජයේ වෘත්තිය පුහුණු අවස්ථා සැලසීම | උගන්ඩාව | 02 |
| 6 | වෘත්තිය පුහුණු ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | සිංගප්පූරුව | 16 |
| 7 | නිපුණතා සංවර්ධනය තුළින් ආර්Óකමය ප්‍රතිලාභ | කටාර් | 01 |
| 8 | අන්තර්ජාතික පරිගණක ජාල සමීක්ෂණ සම්මන්ත්‍රණය | බෘනායි රාජ්‍යය | 02 |
| | **එකතුව** | | **49** |

# දේශීය පුහුණුව (අධ්‍යයන කාර්ය මණ්ඩලය ) –2011

| | පුහුණු ක්ෂේත්‍රය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යාපන මනෝ විද්‍යාව | 70 |
| 02 | පුහුණු ක්‍රමවේදය පිළිබඳ උපදේශකවරුන් පුහුණු කිරිම | 61 |
| 03 | පුහුණුකරුවන් පුහුණු කිරිම | 27 |
| 04 | පාලන කළමනාකරණය හා මිලදි ගැනීම් කලමනාකරණය පිළිබඳ පාඨමාලාව | 03 |
| 05 | නව උපදේශකවරුන් පුහුණු කිරිම | 52 |
| 06 | විදුලි කාර්මික උපදේශන පුහුණු පිළිබඳ පාඨමාලාව | 10 |
| 07 | සඵලතා පරීක්ෂණ වැඩමුළුව | 19 |
| 08 | තත්වපාලන කව වැඩසටහන (Quality Circle) | 140 |
| 09 | ඉදිකිරිමේ උපදේශන පුහුණු වැඩසටහන | 42 |
| 10 | තත්වපාලන කව වැඩමුළුව | 101 |
| 11 | තොරතුරු තාක්ෂණ උපදේශක පුහුණු වැඩසටහන | 26 |
| 12 | සහකාර උපදේශකවරුන් සඳහා පුහුණු වැඩසටහන | 32 |
| 13 | උපදේශකවරුන් I ශ්‍රේණිය සඳහා උසස් කිරිමේ පුහුණු වැඩහටහන | 334 |
| 14 | විෂය ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන ( උපදේශක) | 07 |
| | එකතුව | 924 |

## දේශීය පුහුණුව (අනධ්‍යයන කාර්ය මණ්ඩලය ) - 2011

| | පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | විධිමත් පාලනය තුලින් මානව සම්පත් සංවර්ධනය | 01 |
| 02 | මානව සම්පත් සංවර්ධනය | 05 |
| 03 | සුළු කාර්යය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළුව | 32 |
| 04 | ස්ථිර කාර්යය මණ්ඩලය සඳහා වු වැඩමුළුව | 115 |
| 05 | ආකල්ප සංවර්ධනය කිරිම | 61 |
| 06 | ප්‍රවාහන කළමනාකරණය | 01 |
| | **එකතුව** | 215 |

**05.<u>වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබා දීම</u>**

දිවයින පුරා පිහිටුවා ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 261 තුලින් වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර 15 ක් යටතේ පුහුණු පාඨමාලා 81 ක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2011 වර්ෂයේ දී ආධුනිකයින් 33,792 ක් පුහුණුව සඳහා බඳවා ගන්නා ලද අතර, ඉන් ආධුනිකයින් 30,077 ක් පුහුණු අවසන් කරන ලදී. මෙම සංඛ්‍යාවට ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් හා කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා බඳවා ගන්නා ලද ආධුනිකයින්ද ඇතුලත් කර ඇත.

## වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම/පිටවීම

| වර්ෂය | 2009 | 2010 | 2011 |
|---|---|---|---|
| පුහුණුවට ඇතුලත් වු සංඛ්‍යාව | 32740 | 28445 | 33792 |
| පුහුණුව අවසන් කළ සංඛ්‍යාව | 26200 | 24537 | 30077 |




## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ පාඨමාලා 2011

| ක්ශේත්‍රය | පාඨමාලාව හා කාලය | ආධුනික සංඛ්‍යාව |
|---|---|---|
| 1. ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1. ඇලුමිනියම් පිරිසැකසුම්කරු (මාස 06) | 725 |
| | 2. Auto CAD(මාස 06) | 62 |
| | 3. ඉදිකිරීම් ශිල්පී (මාස06) | 629 |
| | 4. ඉදිකිරීම් කාර්මික ශිල්පී (මාස 12) | 131 |
| | 5. ගෘහනිර්මාණ ශිල්පී (මාස 12) | 174 |
| | 6. උද්‍යාණ අලංකරණ ශිල්පී (මාස 06) | 183 |

| | | |
|---|---|---|
| | 7. පෙදරේරු (මාස 06) | 05 |
| | 8. ජල නල කාර්මික (මාස 06) | 390 |
| | 9.ප්‍රමාණ සමීක්ෂක (මාස 12) | 127 |
| | 10.ලී වැඩ කාර්මික ශිල්පී (ගොඩනැගිලි) (මාස 12) | 72 |
| | | **2498** |
| 2.විදුලි, විද්‍යුත් සහ සන්නිවේදනය | 1. විදුලි මෝටර් එතුම් ශිල්පී (මාස 06) | 430 |
| | 2. විදුලි ශිල්පී (මාස 06) | 1884 |
| | 3. විදුලි ශිල්පී (මාස 12) | 461 |
| | 4. විදුලි මෝටර් පාලන ශිල්පී (මාස 06) | 12 |
| | 5. ගෘහස්ථ විදුලි උපකරණ අලුත් වැඩියා ශිල්පී (මාස 12) | 178 |
| | 6. උපකරණ තාක්ෂණ ශිල්පී (මාස 12) | 38 |
| | 7. ජංගම දුරකථන අලුත්වැඩියා ශිල්පී (මාස 06) | 68 |
| | 8. කාර්යාල උපකරණ අලුත්වැඩියා ශිල්පී (මාස 12) | 24 |
| | 9. ගුවන් විදුලි රූපවාහිනි ආශ්‍රිත උපකරණ අලුත්වැඩියා ශිල්පී (මාස 12) | 346 |
| | | **3441** |
| 3. කෘෂි කාර්මික හා සත්ව පාලනය | 1. මල් හා විසිතුරු පැල (මාස 06) | 36 |
| | 2. පළතුරු හා එළවලු නිෂ්පාදන (මාස 06) | 95 |
| | 3. තවාන් පාලනය හා පැල බද්ධකරු (මාස 06) | 38 |
| | | **169** |

| | | |
|---|---|---|
| 4. මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව | 1. කෘෂි උපකරණ කාර්මික (මාස 12) | 71 |
| | 2. කෘෂි උපකරණ කාර්මික (මාස 06) | 48 |
| | 3. මෝටර් රථ වායු සමීකරණ ශිල්පී (මාස 06) | 39 |
| | 4. මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී (මාස 12) | 125 |
| | 5. මෝටර් රථ කාර්මික (මාස 12) | 631 |
| | 6. මෝටර් රථ පින්තාරු ශිල්පී (මාස 06) | 103 |
| | 7. මෝටර් රථ වෑද්දුම් ශිල්පී (මාස 06) | 106 |
| | 8. රියදුරු - සැහැල්ලු වාහන (මාස 03) | 550 |
| | 9. රියදුරු - බර වාහන (මාස 03) | 49 |
| | 10. මෝටර් බෝට්ටු කාර්මික (බාහිර එන්ජින්) (මාස 12) | 37 |
| | 11. මෝටර් බෝට්ටු කාර්මික (බාහිර එන්ජින්) (මාස 06) | 34 |
| | 12. යතුරු පැදි කාර්මික ශිල්පී (මාස 03) | 59 |
| | 13. යතුරු පැදි කාර්මික ශිල්පී (මාස 06) | 742 |
| | 14. ත්‍රි රෝද රථ කාර්මික ශිල්පී (මාස 06) | 512 |
| | | **3106** |
| 5.තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය | 1. පරිගණක සහතික පත්‍ර පාඨමාලාව (මාස 06) | 1009 |
| | 2. සිස්කෝ (CISCO) (මාස12) | 141 |
| | 3. ජාතික තොරතුරු තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාව (මාස 06) | 898 |
| | 4. ජාතික තොරතුරු හා සන්නිවේදන ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාව (මාස 12) | 427 |
| | 5. පරිගණක චිත්‍ර ශිල්පී (මාස 06) | 239 |
| | 6. පරිගණක දෘඩාංග ශිල්පී (මාස 06) | 567 |

| | | |
|---|---|---|
| | 7. පරිගණක දෘඩාංග ශිල්පී A+ (මාස 06) | 148 |
| | 8. IC3 (මාස 06) | 399 |
| | 9. තොරතුරු තාක්‍ෂණ ශිල්පී (ආබාධිත) | 5 |
| | 10. තොරතුරු තාක්‍ෂණ ශිල්පී (මාස 06) | 2595 |
| | 10. අන්තර්ජාල හා වෙබ් අඩවි සැකසුම් ශිල්පී (මාස 03) | 39 |
| | | **6467** |
| 6. මුද්‍රණ හා ඇසුරුම්කරණය | 1.ඕෆ්සෙට් ලිතෝ මැෂින් ඔපරේටර් (මාස 12) | 37 |
| | | **37** |
| 7.හෝටල් හා සංචාරක කර්මාන්තය | 1. බේකරිකරු (මාස 06) | 288 |
| | 2. සූපවේදී (මාස 06) | 1048 |
| | 3. පිළිගැනීමේ නිලධාරි (මාස 06) | 23 |
| | 4. කාමර සේවක (මාස 06) | 1374 |
| | 5. භෝජනාගාර සේවක (මාස 06) | 900 |
| | | **3633** |
| 8.ලෝහ හා සුලු ඉංජිනේරු | 1. පිත්තල වාත්තු/කැටයම් ශිල්පී (මාස 06) | 18 |
| | 2. ලෝහ පිරිසැකසුම්කරු (මාස 12) | 36 |
| | 3. වෑද්දුම්කරු (සාමාන්‍යය) (මාස 12) | 32 |
| | 4. යන්ත්‍ර ශිල්පී (සාමාන්‍යය) (මාස 12) | 241 |
| | 5. පැස්සුම් ශිල්පී (මාස 12) | 190 |
| | 6. පැස්සුම් ශිල්පී (මාස 06) | 777 |
| | | **1294** |
| 9. මැණික් හා ස්වර්ණාභරණ | 1. මැණික් කැපුම් ශිල්පී (මාස 06) | 24 |
| | 2. ස්වර්ණාභරණ කාර්මික (මාස 12) | 41 |
| | 3. ස්වර්ණාභරණ ගල් අල්ලන්නා (මාස 06) | 46 |
| | | **111** |

| | | |
|---|---|---|
| 10. දැව ආශ්‍රිත නිෂ්පාදන | 1. ලී කැටයම් ශිල්පී (මාස 06) | 100 |
| | 2. ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) (මාස 12) | 201 |
| | 3. ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) (මාස 06) | 992 |
| | 4. දැව භාණ්ඩ නිෂ්පාදනය (මාස 12) | 19 |
| | | **1312** |
| 11.රෙදිපිළි හා ඇඟළුම් | 1. ෆැබ්රික් කටර් (මාස 03) | 22 |
| | 2. ඇගළුම් නිෂ්පාදන සුපරීක්ෂක (මාස 06) | 54 |
| | 3. ඇඟළුම් තත්ව පාලක (මාස 06) | 206 |
| | 4. අධිවේගී මහන යන්ත්‍ර කාර්මික (මාස 06) | 285 |
| | 5. අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු (මාස 03) | 1102 |
| | 6. මෝස්තර නිර්මාණ ශිල්පී (මාස 06) | 199 |
| | 7. තිර මුද්‍රණ ශිල්පී (මාස 06) | 182 |
| | 8. ඇඳුම් මැසීම (පිරිමි) (මාස 06) | 397 |
| | 9. ඇඳුම් මැසීම (ගැහැණු) (මාස 06) | 1933 |
| | 10. වැඩ අධ්‍යයන සහායක (මාස 06) | 27 |
| | | **4407** |
| 12. ශීතකරණ හා වායු සමීකරණ | 1. ශීතකරණ හා වායු සමීකරණ ශිල්පී (මාස 12) | 453 |
| | | **453** |
| 13. වෙනත් | 1. කාර්මික කලමණාකරන ඩිප්ලෝමා (මාස 06) | 46 |
| | | **46** |
| 14.රබර්, ප්ලාස්ටික් හා සම්භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන | 1.සම් භාණ්ඩ නිෂ්පාදක (මාස 06) | 107 |
| | | **107** |

| | | |
|---|---|---|
| 15.පුද්ගල හා සමාජීය සංවර්ධනය | 1. රූපලාවන්‍යය (මාස 03) | 1076 |
| | 2. රූපලාවන්‍යය - ආබාධිත (මාස 03) | 6 |
| | 3. කොණ්ඩා කැපුම් ශිල්පී (පිරිමි) (මාස 06) | 24 |
| | 4. කොණ්ඩා මෝස්තර ශිල්පී (පිරිමි) (මාස 03) | 908 |
| | 5. පෙර පාසල් ගුරු පුහුණුව (මාස 06) | 15 |
| | 6. ලේකම් පරිචය (මාස 09) | 141 |
| | | **2170** |
| **එකතුව** | | **29251** |

# වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර ඉල්ලුම - 2011

| **ක්ෂේත්‍රය** | **ඇතුලත් වූ ආධුනික සංඛ්‍යාව** |
|---|---|
| 1. ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2498 |
| 2.විදුලි, විද්‍යුත් සහ සන්නිවේදනය | 3441 |
| 3.කෘෂි කාර්මික හා සත්ව පාලනය | 169 |
| 4.මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව | 3106 |
| 5.තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය | 6467 |
| 6. මුද්‍රණ හා ඇසුරුම්කරණය | 37 |
| 7.හෝටල් හා සංචාරක කර්මාන්තය | 3633 |
| 8.ලෝහ හා සුලු ඉංජිනේරු | 1294 |

| | |
|---|---|
| 9. මැණික් හා ස්වර්ණාභරණ | 111 |
| 10. දැව ආශ්‍රිත නිෂ්පාදන | 1312 |
| 11.රෙදිපිළි හා ඇඟළුම් | 4407 |
| 12. ශීතකරණ හා වායු සමීකරණ | 453 |
| 13. වෙනත් | 107 |
| 14.රබර්, ප්ලාස්ටික් හා සම්භාණ්ඩ ආශ්‍රිත  නිෂ්පාදන | 2170 |
| 15. පුද්ගල හා සමාජීය සංවර්ධනය | 46 |

**ක්ෂේත්‍රයන් සඳහා පැවති ඉල්ලුම 2011**



# මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු

| වර්ෂය | 2009 | 2010 | 2011 |
|---|---|---|---|
| වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 237 | 236 | 232 |
| දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 22 | 22 | 23 |
| ජාතික වෘත්තීය පුහුණු ආයතන | 06 | 06 | 06 |
| එකතුව | 265 | 264 | 261 |



# පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය හා ආධුනික සංඛ්‍යාව - 2011



## 06. වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශන වැඩසටහන් පැවැත්වීම.

දිවයින පුරා පිහිටුවා ඇති වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකක මගින් තරුණ තරුණියන් හට ඔවුන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ගැළපෙන වෘත්තීය ක්ෂේත්‍රය තෝරා ගැනීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟ පෙන්වනු ලැබේ.

මෙම වැඩසටහන් වලට අනුව 2011 වසරේ දී පාසැල් සිසුන්, පාසැල් හැරයන සිසුන්, වෘත්තීය පුහුණුව හදාරන ආධුනිකයින්, දෙමාපියන් හා ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සංවිධානය කළ වැඩසටහන් 2163ක් මගින් 108607 දෙනෙකු දැනුවත් කිරීමට හැකිවිය.

### වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2011

| ඉලක්ක ගත කණ්ඩායම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| පාසැල් සිසුන් | 401 | 27068 |
| පාසැල් හැරයන්නන් | 621 | 35977 |
| පුහුණුවන්නන් | 250 | 9507 |
| දෙමාපියන් | 319 | 15997 |
| අනෙකුත් | 572 | 20058 |
| එකතුව | **2163** | **108607** |

## වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම

| වර්ෂය | 2009 | 2010 | 2011 |
|---|---|---|---|
| සහභාගී වූ සංඛ්‍යාව | 81,852 | 97,736 | 108607 |



## 07. රැකියාගත කිරීම.

දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන රැකියා ගත කිරීමේ වැඩපිළිවෙල යටතේ, පුහුණුලාභීන් 6618 දෙනෙකු රැකියාගත කරන ලදි.මෙයින් 5927 දෙනෙකු දේශීය රැකියා සඳහා ද 98 දෙනෙකු විදේශීය රැකියා සඳහා ද 593 දෙනෙකු ස්වයං රැකියා සඳහාද යොමු කරනු ලැබිණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය හා විදේශීය රැකියා ආයතන 62ක් ලියාපදිංචි කරන ලදි. මෙසේ ඵලදායී ලෙස රැකියා ගත කිරීම තුලින් ජාතික ආර්ථිකයට රුපියල් මිලියන 863 කින් පමණ දායකත්වයක් ලබා දීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට හැකිවිය.

### රැකියාගත කිරීම පිළිබඳ තොරතුරු

| | දිස්ත්‍රික්කය/ජාතික වෘත්තීය පුහුණු ආයතනය | දේශීය | විදේශීය | ස්වයං | එකතුව |
|---|---|---|---|---|---|
| 1. | ප්‍රධාන කාර්යාලය | 144 | 9 | - | **153** |
| 2. | ජා.වෘ.පු.ආ - නාරාහේන්පිට | 182 | 2 | 13 | **197** |
| 3. | ජා.වෘ.පු.ආ - ඔරුගොඩවත්ත | 201 | 4 | 5 | **210** |
| 4. | ජා.වෘ.පු.ආ - රත්මලාන | 90 | - | 2 | **92** |
| 5. | ජා.වෘ.පු.ආ - නියාගම | 158 | 7 | 15 | **180** |
| 6. | ජා.වෘ.පු.ආ - බද්දේගම | 46 | - | 4 | **50** |
| 7. | කොළඹ | 347 | 3 | 20 | **370** |
| 8. | ගම්පහ | 304 | 4 | 46 | **354** |
| 9. | කළුතර | 371 | 3 | 34 | **408** |
| 10. | ගාල්ල | 349 | 1 | 23 | **373** |
| 11. | මාතර | 123 | 2 | 1 | **126** |
| 12. | හම්බන්තොට | 351 | 3 | 38 | **392** |
| 13. | බදුල්ල | 246 | 1 | 4 | **251** |
| 14. | මොණරාගල | 115 | 1 | 15 | **131** |
| 15. | රත්නපුර | 185 | - | 18 | **203** |
| 16. | කෑගල්ල | 476 | 5 | 30 | **511** |
| 17. | මහනුවර | 500 | 18 | 57 | **575** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 18. | මාතලේ | 284 | 12 | 56 | **352** |
| 19. | නුවරඑළිය | 254 | - | 14 | **268** |
| 20. | පොළොන්නරුව | 179 | - | 6 | **185** |
| 21. | අනුරාධපුර | 236 | 1 | 42 | **279** |
| 22. | කුරුණෑගල | 222 | - | 70 | **292** |
| 23. | පුත්තලම | 153 | 7 | 9 | **169** |
| 24. | අම්පාර | 209 | 6 | 54 | **269** |
| 25. | ත්‍රිකුණාමලය | 102 | 9 | 14 | **125** |
| 26. | මිරිජ්ජවිල | 65 | - | 3 | **68** |
| 27. | වව්නියා | 35 | - | - | **35** |
| | **එකතුව** | **5927** | **98** | **593** | **6618** |

## රැකියා ස්ථාපනය තුලින් ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය

| වර්ගය | රැකියා ස්ථාපනය | ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය (රුපියල් මිලියන) |
|---|---|---|
| දේශීය | 5927 | 721.512 |
| විදේශීය | 98 | 41.556 |
| ස්වයං | 593 | 100.308 |
| **එකතුව** | **6,618** | **863.376** |

❖ 2011 වර්ෂයේ රැකියා ගත කරන ලද පුහුණු ලාභීන් සංඛ්‍යාව වසරකට ලබන ආදායම දළ වශයෙන් ඇස්තමේන්තු කර සකස් කර ඇත.

**රැකියා ස්ථාපනය කල සංඛ්‍යාව**

| **වර්ෂය** | **දේශීය** | **විදේශීය** | **ස්වයං** | **එකතුව** |
|---|---|---|---|---|
| 2009 | 4197 | 47 | 338 | **4582** |
| 2010 | 4370 | 130 | 826 | **5326** |
| 2011 | 5927 | 98 | 593 | **6618** |

❖ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් රැකියාගත කල තොරතුරු පමණි.




08. **<u>රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධතා ගොඩනැගීම මගින් ශිල්පීය දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.</u>**

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට තමාගේ දැනුම හා කුසලතාවය වර්ධනය කර ගැනීමටත්, වෙනස් වන ලෝකයේ නව තාක්ෂණික දැනුම ලබා දීමත් අරමුණු කරගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව 2011 වසරේදී රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන 06 ක සහය ඇතිව මෙවැනි වැඩසටහන් 35 ක්, ක්ෂේත්‍ර 06 ක් සඳහා පැවැත්වීමට හැකි වූ අතර, 3029 දෙනෙකුට තම හැකියාවන් වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සැලසිනි.

## කුසලතා සංවර්ධන වැඩසටහන් හි ප්‍රගතිය

| | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | අනුග්‍රාහක ආයතන |
|---|---|---|---|---|
| 1 | ටයිල් ඇතිරීම | 13 | 496 | • ලංකා ටයිල්ස් සමාගම |
| 2 | රූපලාවන්‍ය | 13 | 2080 | • නේචර්ස් බියුටි ක්‍රියේෂන් පුද්ගලික සමාගම<br>• ඔරිෆ්ලේම් පුද්ගලික සමාගම |
| 3 | ත්‍රී රෝද රථ හා යතුරුපැදි අළුත්වැඩියාව | 01 | 58 | • ඩේවිඩ් පීරිස් පුද්ගලික සමාගම |
| 4 | බේකරි | 05 | 270 | • ඒ.බී.මයුරි සමාගම |
| 5 | ඉදිකිරීම් | 02 | 79 | • හොල්සිම් ලංකා සමාගම |
| 6 | විදුලි කාර්මික | 01 | 46 | • ACL කේබල් පුද්ගලික සමාගම |
| **එකතුව** | | **35** | **3029** | |

## 09. <u>අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.</u>

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ අරමුණු ලගා කර ගැනීම සඳහා ගත් විවිධ ක්‍රියාමාර්ග අතර වෘත්තීය පුහුණු අවස්ථා වැඩි දියුණු කිරීම හා ගුණාත්මක භාවය වැඩිකිරිම අරමුණු කරගනිමින් 2011 වසර තුල දී විවිධ රාජ්‍ය හා පෞද්ගලික අධ්‍යාපන ආයතන සමග අවබෝධතා ගිවිසුම් 23 කට අත්සන් කරනු ලැබිය.

එම අවබෝධතා ගිවිසුම පහත පරිදි වේ.

| | අවබෝධතා ගිවිසුම | ආයතනය |
|---|---|---|
| 1 | ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්ට පවත්වාගෙන යාම. | කොළඹ තරුණ බෞද්ධ සංගමය. |
| 2 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරිපිටිය හා දාගම වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයන්ට උපකරණ හා කාර්යාල උපකරණ සැපයීම. | ජ්ලැන් (ශ්‍රී ලංකා) සංවිධානය. |
| 3 | සේනපුර හා තිස්සමහරාමය YES පදනමට අයත් ගොඩනැගිලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන් බවට පත් කිරිම. | YES පදනම. |
| 4 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා වෙබ් අඩවි සංවර්ධන ව්‍යාපෘතිය. | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ (ICTA) ආයතනය |
| 5 | අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයන්හි තරුණයින් සඳහා පෙදරේරු, වඩුකාර්මික, ජලනල කාර්මික, විදුලි කාර්මික හා ඇලුමිනියම් පිරිසැකසුම් ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබා දීම. | Chamber Of Construction Industry |
| 6 | මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති චන්දරාමුල්ල හා ඔන්ඩච්චිමඩම් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්ට නවීන යන්ත්‍ර උපකරණ දි සංවර්ධනය කිරීම. | ඉන්දියානු රජය. |
| 7 | තෝරාගත් පාසල් ගුරුවරු 24 දෙනෙකු සඳහා වෙබ් අඩවි නිර්මාණ පුහුණුව හා දෘඩාංග පුහුණුව ලබා දීම. | අධ්‍යාපන අමාත්‍යාංශය. |
| 8 | අධිවේගි මහන යන්ත්‍ර ක්‍රියාකරු පුහුණුව ලබා දීම. | බ්‍රැන්ඩික්ස් කැෂුවල් වෙයාර් (ගම්පහ) සමාගම. |
| 9 | ශ්‍රී ලංකාවේ යෞවනයින්ගේ නිපුණතාවයන් වර්ධනය කර ගැනීමට තොරතුරු තාක්‍ෂණ පාඨමාලාවන් කරගෙන යාමට පහසුකම් සැපයීම. | මෘදුකාංග හා සේවා සමාගම (ශ්‍රී ලංකා) සංවිධානය. |
| 10 | නුවරඑළිය, දික්ඔය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට ගොඩනැගිලි ලබා දීම. | වටවල ප්ලාන්ටේෂන් සමාගම. |
| 11 | ගම්පහ, මීගමුව හා පුත්තලම දිස්ත්‍රික්කයන් හි තරුණ තරුණියන් 120 දෙනෙකු සඳහා නිපුණතා සංවර්ධන පුහුණු පාඨමාලා පැවැත්වීම. | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂි කර්මාන්ත සංවිධානය. |

| | | |
|---|---|---|
| 12 | හම්බන්තොට, තංගල්ල හෝටල් පාසලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලක් ලබා දීම. | සීමාසහිත හම්බන්තොට දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයට |
| 13 | මහනුවර වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට ගොඩනැගිලි ලබා දීම. | මහනුවර තරුණ බෞද්ධ සංගමය. |
| 14 | හෝටල් හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ඒ ක්ෂේත්‍රයට අදාල පාඨමාලා ප්‍රවර්ධනය කිරීම. | සංචාරක හා හෝටල් (ශ්‍රී ලංකා) සංවිධානය. |
| 15 | තොරතුරු තාක්ෂණ පාඨමාලා නිර්මාණය කිරීම හා ඒ අනුව පුහුණුව ලැබූ ආධුනිකයන්ට මෘදුකාංග හා සංවර්ධන ව්‍යාපෘතීන් හී රැකියා අවස්ථා සැලසීම. | **Virtusa** පුද්ගලික සමාගම |
| 16 | ජාතික යොවුන් සේනාංකයට අයත් ගොඩනැගිලි වල වෘත්තීය පුහුණු මධස්ථානය ආරම්භ කර පවත්වාගෙන යාම. | ජාතික යොවුන් සේනාංකය. |
| 17 | ප්‍රවීන රූපලාවන්‍ය ශිල්පිනී රන්මලි ගුණවර්ධන හා එක්ව නාරාහේන්පිට ජාතික වෘත්තිය පුහුණු ආයතනයේ රූපලාවන්‍ය හා කොන්ඩා සැකසුම් ශිල්පී පාඨමාලාවක් පවත්වාගෙන යාම. | රන්මලි ඇසෝසියේටඩ් පෞද්ගලික සමාගම. |
| 18 | මයික්‍රෝෂොෆ්ට් (ශ්‍රී ලංකා) **Micro soft (Sri Lanka)** සමාගම් අධිකාරිලත් පුහුණු වැඩසටහන් පැවැත්වීම. | මයික්‍රෝෂොෆ්ට්(ලංකා) සමාගම |
| 19 | දික්වැල්ල ප්‍රදේශීය සභාවට අයත් ගොඩනැගිල්ලක් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට ලබා දීම. | දික්වැල්ල ප්‍රදේශීය සභාව |
| 20 | දිවයින පුරා සිටින වෘත්තිය පුහුණු අධිකාරියේ පුහුණු ලාභින්ට **IC3** සහතිකය ලබා දීම ප්‍රවර්ධනය කිරීම . | ටෙක්වන් ග්ලෝබල් පුද්ගලික සමාගම. |
| 21 | ඉදිකිරීම් පාඨමාලා ප්‍රවර්ධනය කිරීම හා ඒ ආශ්‍රිත රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම. | ජාතික ඉදිකිරීම් සංගමය (ශ්‍රී ලංකා) |
| 22 | විදේශ ශ්‍රම වෙළදපලේ අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් අම්පාර දිස්ත්‍රික්කයේ නිපුණ ශිල්පීන් 500ක් පුහුණු කිරිම. | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය. |
| 23 | සමෘද්ධි අධිකාරියේ නිලධාරීන් සඳහා පරිගණක දෘඩාංග **A+** පුහුණුව ලබා දීම. | ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය |

## 10. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නියැළෙන්නන් හට කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරයන් ආරම්භ කිරීමට මඟ පෙන්වීමක් වශයෙන් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ. 2011 වර්ෂයේ දී දිවයින පුරා පැවති මෙවැනි වැඩසටහන් 39 ක් මගින් 754 දෙනෙකු සඳහා සේවය ලබා දීමට හැකිවිය. තවද තෝරාගත් පාඨමාලා සඳහා පුහුණුව ලබමින් සිටින කාලය තුල "ඔබේ ව්‍යාපාරය ගැන දැන ගන්න" (Know About Business)වැඩසටහන් 31 ක් මගින් 788 දෙනෙක් සඳහා ව්‍යාපාරික දැනුම හා කුසලතාවය ලබා දීමට හැකිවිය.

මේවැනි වැඩසටහන් තුළින් ලබාගත් දැනුම උපයෝගී කරගනිමින් ව්‍යාපාර සැලසුම් සකස් කර 2011 වසර තුල දී වෘත්තීය පුහුණුව ලත් ආධුනිකයන් 160 දෙනෙකුට රුපියල් මිලියන 28 කට ආසන්න මුදලක් ණය වශයෙන් මහජන බැංකුව, රුහුණු සංවර්ධන බැංකුව වැනි රාජ්‍ය බැංකු වලින් ලබා ගැනීමට කටයුතු සම්පාදනය කර දීමට හැනි වීම මඟින් ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු ආයතනය මඟින් තරුණ ව්‍යාවසායකයන් සවිබල සවිබල ගැන්වීමට හැකි විය.

### 1.3. අභියෝග

- නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් පුහුණු කටයුතු කිරීම සඳහා හැකියාව ඇති උපදේශක වරුන්ගේ හිඟකම හා ඔවුන්ට ඉහළ මට්ටමේ වැටුපක් ගෙවීමට ඇති අපහසුතාවය.
- පුහුණු කිරීමේ ක්ෂේත්‍ර හා රැකියා අවස්ථා අතර ඇති නොගැලපීම අවම කර ගැනීම.
- සේවා සපයන ආයතනයක් ලෙස රජය විසින් වෙන් කරන ප්‍රාග්ධනය හා පුනරාවර්ථන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- දිවයින පුරා ක්‍රියාත්මක සෑම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකම සමාන මට්ටමේ පහසුකම් සැපයීමට අපොහොසත් වීම.
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීම.
- වෘත්තීය පුහුණුවේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීමට පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් දියත් කිරීමට සිදු වීම.

- වෘත්තීය පුහුණුව සපයන පෞද්ගලික අංශයේ ආයතන හා තරගකාරීව කටයුතු කිරීමට සිදුවීම.

- වෘත්තීය පුහුණුව සපයන රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ආයතන හරහා සපයන පහසුකම් වැඩිවීම නිසා ඒ අයුරින්ම පහසුකම් සැපයීම අපහසු වීම.

- තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවීම.

- ශ්‍රම ඉල්ලුමක් ඇති ශිල්පීය මට්ටමේ පාඨමාලාවන්ට තරුණ තරුණියන්ගේ වැඩි නැඹුරුතාවයක් නොමැති වීම.

**<u>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය</u>**

**<u>විගණන හා කළමණාකරණ කමිටුව</u>**

**<u>කාර්ය සාධනය 2011</u>**

01) කමිටු සමාජිකයින්

| | | |
|---|---|---|
| U.G.K සමරසේකර මහතා | කමිටු සභාපති | 2011 පෙබරවාරි දක්වා |
| හේරත් යාපා මහතා | කමිටු සමාජික | |
| නිමල් වීරතුංග මහතා | කමිටු සමාජික | |

| | | |
|---|---|---|
| K.M.M. සිරිවර්ධන මහතා | කමිටු සභාපති | 2011 පෙබරවාරි වලින් පසු |
| හේරත් යාපා මහතා | කමිටු සමාජික | |
| නිමල් වීරතුංග මහතා | කමිටු සමාජික | |

02) වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් ගණන - 04

විගණන හා කළමනාකරණ කමිටුව විසින් 2011 වසර තුළ දී ගෙන ඇති වැදගත් තීරණ සමහරක් පහත පරිදි වේ.

1. විධිමත් ලෙස ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියට පවරා ගැනීමට නියමිතව ඇති ඉඩම් වල තනා ඇති ගොඩනැගිලි වල වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොමැති බැවින් එම වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු යෙදීම.

2. රජයේ විගණන විමසුම හා එම විමසුම් වලට අදාළ පිළිතුරු විගණන හා කළමණාකරණ කමිටුවේ සමාලෝචනයට ලක් කර නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කිරීම.

3. ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය වෙනුවෙන් පරිපාලන කටයුතු සඳහා අත්පොතක්, මුදල් කටයුතු පිළිබඳ පොතක්, පිළියෙල කිරිමේ කටයුතු කඩිනම් කර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට යොමු කිරීම.

4. අභ්‍යන්තර විගණන වාර්තා මඟින් පෙන්වා දෙනු ලබන වැරදි හා අඩුපාඩු මඟ හරවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රගතිය සමාලෝචනය කිරීම

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01. | පිළිගැන්වීම | 38 |
| 02. | අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනය | 39 |
| 03. | 2011 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව | 40 |
| 04. | 2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ වාර්තාව | 41 |
| 05. | 2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 42 |
| 06. | දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 43 |
| 07. | ගිණුම්කරණ ප්‍රතිපත්ති | 44-47 |
| 08. | මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | 48-61 |

**පිළිගැන්වීම**

2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී මහ භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුව වෙත මුලු ප්‍රදාන ලෙස රු 1,363,559,445.97අධිකාරිය වෙත මුදා හැර අති අතර විස්තර පහත දැක්වේ.

| 1.1 රජයේප්‍රදාන | ප්‍රතිපාදන (රු) | මුදාහරින ලද මුදල(රු) |
|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන- පුනරාවර්තන | 810,000,000.00 | 807,600,000.00 |
| භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන | 600,000,000.00 | 457,500,000.00 |
| අමාත්‍යාංශ අරමුදල | 350,000,000.00 | 72,446,781.85 |
| UNICEF | 11,780,240.40 | 11,780,240.40 |
| TVEC - අරමුදල | 9,277,010.00 | 9,277,010.00 |
| WUSC | 2,284,786.00 | 2,284,786.00 |
| HMTI | 1,613,127.72 | 1,613,127.72 |
| කලාපීය ධීවර කර්මාන්තය | 1,057,500.00 | 1,057,500.00 |
| **එකතුව** | **1,786,012,664.12** | **1,363,559,445.97** |

| 1.2 ආදායම | ඇස්තමේන්තුගත (රු) | ඉපයූ ආදායම (රු) |
|---|---|---|
| **ආදායම** | 72,000,000.00 | 97,977,834.91 |

2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා මේ සමග ඉදිරිපත් කරමි

පහත දැක්වෙන ලේඛන ඇතුළත් වේ

01. 2011 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය තත්ත්වයපිළිබඳ වාර්තාව
02. 2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ වාර්තාව
03. 2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය
04. 2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
05. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

...............................................

...............................................

ධම්මික හේවාපතිරණ
සභාපති

හේමාලි එදිරිසිංහ
සහකාර ගණකාධිකාරි

## 2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ
## පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව
## <u>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය</u>

2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මෙන්ම 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ සහ 1971 අංක 38 දරන මූල්‍ය පනතේ දක්වා ඇති අකාරයෙන් සකසා ඇත.

